## WEATHER FORECAST FOR 17 AUGUST 2019
(Issued at 05.30 a.m. on 17 August 2019)

**General public is kindly requested to take adequate precautions to minimize damages caused by temporary localized strong winds and lightning since the possibility for afternoon thundershowers is high particularly in Northern, North-central and Eastern provinces.**

Showers will occur at times in Central and Sabaragamuwa provinces and in Jaffna, Mannar and Killinochchi districts.

Several spells of showers will occur in Western province and in Galle and Matara districts.

Showers or thundershowers will occur at several places elsewhere after 2.00pm.

Fairly heavy falls above 50 mm are likely at some places in Northern, North-central, Eastern, Central and Uva provinces.

සවස් කාලයේදී ගිගුරුම් සහිත වැසි ඇති වීමේ වැඩි හැකියාවක් ඇති බැවින්, විශේෂයෙන් උතුරු, උතුරු මැද සහ නැගෙනහිර පළාත්වල තාවකාලිකව තද සුළං ඇතිවිය හැකි අතර අකුණු මඟින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

මධ්‍යම සහ සබරගමුව පළාත්වලත් යාපනය, මන්නාරම සහ කිලිනොච්චි දිස්ත්‍රික්කවලත් විටින් විට වැසි ඇති වේ.

බස්නාහිර පළාතේත් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්ක වල වැසි වාර කිහිපයක් ඇතිවේ.

සෙසු පළාත්වල තැනින් තැන සවස 2.00 න් පමණ පසුව වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.

උතුරු, උතුරු මැද, නැගෙනහිර, මධ්‍යම සහ ඌව පළාත්වල ඇතැම් ස්ථාන වලට මි.මී. 50 ට වැඩි තරමක තද වර්ෂාපතනයන් ඇතිවිය හැක.

## WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS (Issued at 05.30 a.m. on 17 August 2019)

Showers or thundershowers will occur in the sea area extending from Mannar to Mullaitivu via Kankasanturai and fairly heavy showers can be expected in the deep sea areas also.

Showers or thundershowers will occur at several places in the sea area extending from Colombo to Hambantota via Galle.

Showers or thundershowers may occur at several places in the other sea areas around the island in the evening or night.

Winds will be Westerly to South-westerly and speed will be (30-40) kmph in the sea areas around the island.

The sea area extending from Mannar to Pottuvil via Puttalam, Colombo and Hambanthota, can be rough at times as the wind speed can increase up to (50-55) kmph at times.

**Sudden increase of wind speed up to 60 kmph and seas can be very rough in the sea areas extending from Pottuvil to Hambantota.**

**Temporarily strong gusty winds and rough seas can be expected during thundershowers.**

**Naval and fishing communities are requested to be vigilant in this regard.**

## ඉදිරි පැය 24 සඳහා දිවයින වටා ඇති මුහුදේ කාලගුණ තත්ත්වය
2019 අගෝස්තු මස 17 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදී.

මන්නාරම සිට කන්කසන්තුරය හරහා මුලතිවු දක්වා වන මුහුදු ප්‍රදේශවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවන අතර ගැඹුරු මුහුදු ප්‍රදේශවල තරමක් තද වැසි ද අපේක්ෂාකළ හැක.

කොළඹ සිට ගාල්ල හරහා හම්බන්තොට දක්වා වන මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.

දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශවලද සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැක.

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං බස්නාහිර සිට නිරිත දක්වා දිශාවලින් හමා එන අතර සුළගේ වේගය පැ.කි.මී. (30-40) පමණ වේ.

මන්නාරම සිට පුත්තලම, කොළඹ සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (50-55) දක්වා වැඩි විය හැකි අතර එම මුහුදු ප්‍රදේශ විටින් විට රළු විය හැක.

හම්බන්තොට සිට පොතුවිල් දක්වා මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය පැ.කි.මී. 60 දක්වා ක්ෂණිකව ඉහල යාමට හැකියාවක් පවතී.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව රළු විය හැක.

ධීවර සහ නාවුක ප්‍රජාව මේ පිලිබදව ඉතා අවධානයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

කාලගුණ විද්‍යාඥ (Duty Meteorologist),
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (Department of Meteorology)

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date: 2019/08/17
Time: 05.35 a.m.
D(Ops)/DO/AO
DISASTER MANAGEMENT CENTRE